# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2122/41 - 2019 මැයි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2019.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙහි I උපලේඛනයේ දක්වා ඇති දැනටමත් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය හැර II උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම ලේඛනයේ II වැනි තීරුවෙහි තදානුරූපිව මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශය එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

තවද, මෙහි I උපලේඛනයේ දක්වා ඇති දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය සහ II උපලේඛනයේ II වැනි තීරයේ දක්වා ඇති ප්‍රදේශයද ඇතුළුව සමස්ථ ප්‍රදේශය පුළුල් කරන ලද ඇල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 21 වැනි දින,
17 සහ 18 මහල්, ''සුහුරුපාය'',
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**I උපලේඛනය**

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| 2008 ජුලි මස 08 දිනැති අංක 1558/5 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* | ඇල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය |




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II උපලේඛනය**

**ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය ප්‍රකාශයට පත්කිරීම**

*I වන තීරුව*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 68සී - මදුරගම, 68ඊ - යහලවෙල, 68එෆ් - ඉඩමේගම, 68 ජේ - නිව්බර්ග්, 69ඊ කිතල් ඇල්ල, 69 එෆ් - රාවණා ඇල්ල, 69ජී - හෙට්ටිපොළ යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වල පිහිටියා වූ මෙහි II වන තීරුවේ විස්තර වන මායිම් සහ ඉම් වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වන තීරුව*

*උතුර :*

හෙට්ටිපොල, ඉඩමේගම ග්‍රාම නිලධාරි වසම් වෙන්වන බදුලු ඔය හරහා වැටී ඇති පාලමේ මධ්‍ය ලක්ෂයෙන් ආරම්භ වී එතැන් සිට, උතුරට, ඊසාන, ගිනිකොන දෙසට, බදුලු ඔය මහ කඳුර හමුවන මධුරගම, ඉඩමේගම ග්‍රාම නිලධාරී වසම් වෙන්වන මායිම දක්වා ද; එතැන් සිට, නැගෙනහිරට, ඊශාන දෙසට බදුලු ඔය දකුණු ඉවුර ඔස්සේ ගමන් කර දෙමෝදර වතු යායේ නෙදර්විල් වතු කොටස හමුවන ස්ථානය දක්වා ද; එතැන් සිට, ගිනිකොන, උතුර, ගිනිකොන, දකුණ, නැගෙනහිර දෙසට එම නෙදර්විල් වතු මායිම ඔස්සේ ගමන් කර එම වතු මායිම බොරගොල්ල කඳුර හමුවන තෙක්, එතැන් සිට නැගෙනහිර, දකුණ, ගිනිකොන, ඊශාන, නැගෙනහිර දෙසට බොරගොල්ල කඳුර දකුණු ඉවුර ඔස්සේ ගමන් කර බදුල්ල - කොළඹ දුම්රිය මාර්ගය හමුවන ස්ථානය දක්වාද; එතැන් සිට, පහළවෙල කඳුර දකුණු ඉවුර ඔස්සේ නැගෙනහිරට ගමන් කර එතැන් සිට සවුදන් වත්තට ළඟා වන අඩිපාර ඔස්සේ ඊසාන, නැගෙනහිරට ගමන් කර නිව්බර්ග් වතුයායේ මායිම හමුවන ලක්ෂය දක්වා.

*නැගෙනහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට නිව්බර්ග් වතු මායිමේ ගිණිකොණ, දකුණ, නැගෙනහිර, දකුණ ඔස්සේ ඇල්ල - පස්සර ප්‍රධාන මාර්ගයේ 5 වන සැතපුම් කණුව දක්වා ද; එතැන් සිට, ගෝවුස්ස ගමට යන මාර්ගය ඔස්සේ දකුණු, ගිනිකොන, නිරිතට ගමන් කර කොල - හුලේ කඳුර හමුවන ලක්ෂය දක්වා.

*දකුණ :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට නිව්බර්ග් වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත, බටහිර හා නිරිත දෙසට ගමන් කර රාවණා ඇල්ල වසමේ නැගෙනහිර මායිම වන කිරිඳි ඔය හමුවන ලක්ෂය දක්වා ද; එතැන් සිට, කිරිඳි ඔය දකුණු ඉවුර ඔස්සේ ගිනිකොන, නිරිතට ගමන් කර එතැන් සිට, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මායිම හමුවන ලක්ෂය දක්වා ද; එතැන් සිට, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මායිම හා රාවණා ඇල්ල ග්‍රාම නිලධාරි වසම් වෙන් වන මායිම ඔස්සේ වයඹ, ඊසානට ගමන් කර බක්මීගොඩ කඳුර ආරම්භක ස්ථානය දක්වා ද; එතැන් සිට, වයඹ දෙසට කිතල් ඇල්ල ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම වන බක්මීගොඩ කඳුර දකුණ ඉවුර ඔස්සේ වයඹ දෙසට කිරිඳි ඔය හමුවන ස්ථානය දක්වා.

**II** උපලේඛනය *(සම්බන්ධිතයි)*

*I වන තීරුව*

*II වන තීරුව*

*බටහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිතල් ඇල්ල වසමේ බටහිර මායිම් වන කිතල්ඇල්ල හා හීල්ඔය වසම් වෙන් වන මලඔඩය ඔස්සේ වයඹ, බටහිර, උතුරට ඇල්ල කිතල් ඇල්ල මාර්ගයේ පිහිටි ජල සම්පාදන මණ්ඩලයේ ජල ගබඩා ටැංකිය දක්වා ද; එතැන් සිට, රජයේ වන වගාව මැදින් වැටී ඇති ගුරු පාර ඔස්සේ උතුරට ගමන් කොට ගුරුඅඹේකඳුර ආරම්භක ස්ථානය දක්වා ද; එතැන් සිට, එම කඳුර ඔස්සේ උතුර, වයඹ, උතුර, වයඹ, උතුර, ඊසානට ගමන් කර කිතල් ඇල්ල හා හෙට්ටිපොල ග්‍රාම නිලධාරි වසම් වෙන් වන මායිම දක්වා ද; එතැන් සිට, උතුරට, ඊසානට, වයඹට ගමන් කර කුඹල්වෙල හන්දියෙහි, ඇල්ලවැල්ලවාය ප්‍රධාන මාර්ගය (A 23) හමුවන ස්ථානය දක්වා ද; එතැන් සිට, බදුලු ඔය දකුණු ඉවුර ඔස්සේ ඊසාන, උතුර, ඊසාන, නැගෙනහිර, ඊසානට ගමන් කර ඉඩමේගම ග්‍රාම නිලධාරි වසමෙහි මායිම හමුවන ස්ථානය දක්වා.

05 - 585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.